# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1902/6 – 2015 පෙබරවාරි 16 වැනි සඳුදා – 2015.02.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2015 අංක 24 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/7/2014/HW/246.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: 10/3/1/3/67.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් අමාත්‍ය මුණසිංහ කාරියවසම් අප්පුහාමිලාගේ දොන් සෝමදාස ගුණවර්ධන වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

එම්. කේ. ඒ. ඩී. එස්. ගුණවර්ධන,
ඉඩම් අමාත්‍ය.

2015 පෙබරවාරි මස 12 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
1200/6, රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරී.**– ප්‍රාදේශීය ලේකම්, රත්තොට.

2. **ඉඩමේ විස්තරය.**– මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, රත්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පල්ලේසියපත්තුව සුළු කොට්ඨාසයේ, කොට්ඨාස අංක ඊ 371 සී විහාරගම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ කුඹුරේගම්මැද්ද ගමේ පිහිටි, මාතලේ දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරිගේ අංක: මා 1632 හා 2014.07.23 දිනැති මූලික පිඹුරේ පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණවලින් යුත් ඉඩම් කැබලිවලට මායිම්:

01. **කැබලි අංක 3 – සුදු ගඟ වත්ත – ප්‍රමාණය: හෙක්. 0.0120**
උතුරට: මෙම පිඹුරේ කැබලි අංක 2, මු.පි.මා. 246 හි කැබලි අංක 3 සහ මාර්ගය; නැගෙනහිරට: මු.පි.මා. 246 හි කැබලි අංක 3; දකුණට: කැබලි අංක 4; බටහිරට: කැබලි අංක 1 සහ 2.

02. **කැබලි අංක 5 – සුදු ගඟ වත්ත – ප්‍රමාණය: හෙක්. 0.0077**
උතුරට: කැබලි අංක 6 සහ 4; නැගෙනහිරට: මෙම පිඹුරේ කැබලි අංක 4 සහ මු.පි.මා. 246 හි කැබලි අංක 3; දකුණට: මු.පි.මා. 246 හි කැබලි අංක 3; බටහිරට: මු.පි.මා. 701 හි කැබලි අංක 27 සහ මෙම පිඹුරේ කැබලි අංක 6.

03 - 29


1A – G21006 – 32 (2015/02) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*